# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2018 මැයි මස 18 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2018.05.18 දින නිකුත් කරන ලදී)**


# සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන)

**2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අධිකරණ අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිල : රු. 68.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 20.00 යි.**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාවය දැක්වීමේ පනතේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු වන්නා වූ සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීම සම්බන්ධයෙන් වන යම් ජාත්‍යන්තර හෝ කලාපීය සම්මුතියක හෝ වෙනත් ජාත්‍යන්තර ගිවිසුමක පාර්ශ්වකරුවකු වන්නා වූ රටවල් සඳහා;

(ආ) සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීම සඳහා ශ්‍රී ලංකාව සමඟ යම් ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් රටක් සඳහා;

(ඇ) එය ස්වෛරී ජාතීන්ගේ උපරිම ශුභසිද්ධිය උදෙසා හේතු වන බවට අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි, ශ්‍රී ලංකාව සමඟ කිසිදු ගිවිසුමකට ඇතුළත් වී නොමැති යම් රටක් සඳහා; හෝ

(ඈ) ජාත්‍යන්තර සාපරාධී කාරණාවලට එරෙහිව ක්‍රියා කරනු ලබන යම් සංවිධානයක් සඳහා,

ප්‍රධාන ප්‍රඥප්තිය අදාළ වීම පුළුල් කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර ප්‍රතියෝජිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ අරමුණු පුළුල් කිරීම සහ සහාය සීමා නොකිරීම වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර ප්‍රතියෝජිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ පනතේ ඵලදායී පරිපාලනය සඳහා විධිවිධාන සැලැස්වීම වේ. මධ්‍යම බලධරයාගේ කාර්යය සහ කර්තව්‍ය නිශ්චිතව දැක්වීම සඳහා මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට 4අ යන අලුත් වගන්තිය ද ඇතුළත් කරනු ලැබේ.

***5 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර ප්‍රතියෝජිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට අදාළ කාර්යය පටිපාටිය නිශ්චිතව සඳහන් කිරීම වේ. එසේම මේ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියට 5අ සහ 5ආ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර ඉහත දැක්වෙන වගන්තිවල නීතිය බලපෑම වනුයේ ඉල්ලීම් සඳහා වහාම ප්‍රතිචාර දැක්වීම සහ නිරායාසයෙන් තොරතුරු සම්ප්‍රේෂණය කිරීම සඳහා විධිවිධාන සැලසීම වේ.

***6 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ අපරාධ විමර්ශන හෝ නඩු කටයුතු ශ්‍රී ලංකාවේ ආරම්භ කර තිබෙන අවස්ථා ඇතුළත් කරමින් සහාය දීම ප්‍රතික්ෂේප කිරීමේ පදනම් පුළුල් කිරීම වේ.

***7 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට 6අ යන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ. අලුත් වගන්තිය රහස්‍යභාවය ආරක්ෂා කළ යුතු බවට විධිවිධාන සලසයි.

***8 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ තැනැත්තකුගේ අනන්‍යතාව නොදන්නා අවස්ථාවක දී සහාය දීමේ කාර්යය පටිපාටිය ඇතුළත් කිරීම, ප්‍රශ්න කිරීම සහ ප්‍රකාශයක් වාර්තා කිරීම සඳහා බලය ඇති බලධරයන් නිශ්චිතව සඳහන් කිරීම වේ.

***9 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ලේඛනයක් හෝ වෙනත් අධිකරණ විධානයක් මහෙස්ත්‍රාත් අධිකරණය වෙත යැවීම සඳහා මධ්‍යම බලධරයා හට පවතින අභිමතය ඉවත් කිරීම වේ.

***10 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ සාක්ෂි ගැනීම හෝ ලේඛන හෝ භාණ්ඩ ලැබීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම වේ.

***11 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර ප්‍රතියෝජිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ විමර්ශනය සඳහා වන සාක්ෂි මූලාශ්‍ර පුළුල් කිරීම වේ.

***12 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ වගන්තියේ නීතිය බලපෑම වනුයේ මධ්‍යම බලධරයා විසින් සිදුකරන ලද නියෝගයන්ට නිශ්චිතභාවය ලබා දීම වේ.

***13 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ සිරකරුවන් සම්බන්ධයෙන් මධ්‍යම බලධරයා විසින් සිදුකරන ලද නියෝගයන්ට නිශ්චිතභාවය ලබා දීම වේ.

***14 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට 13අ සහ 13ආ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලැබේ. අලුත් වගන්ති මඟින් වීඩියෝ සංවාද තාක්ෂණය සහ ඒකාබද්ධ විමර්ශන සඳහා පහසුකම් සැලසීම උදෙසා විධිවිධාන සලසනු ලැබේ.

***15 වන වගන්ති :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් Vඅ වන කොටස ඇතුළත් කරනු ලැබේ. අලුත් කොටස මඟින් විදේශීය රාජ්‍ය නිලධරයන්ට හෝ පොදු ජාත්‍යන්තර සංවිධානයන්ගේ නිලධරයන්ගේ අල්ලස් ගැනීම් සම්බන්ධයෙන් වන සහාය ලබා දීම පිළිබඳව විධිවිධාන සලසනු ලැබේ.

***16 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර ප්‍රතියෝජිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ යම් තැනැත්තකු හඳුනාගැනීමට, ඔහු සිටින ස්ථානය සොයා ගැනීමට හෝ දේපළෙහි වටිනාකම තක්සේරු කිරීමේ දී සහාය වීමට අදාළ නීතිය බලාත්මක කිරීමේ බලධරයාට විධාන කිරීම වේ.

***17 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ සාපරාධී කාරණා හා සම්බන්ධිත කාරණා ඇතුළත් කිරීම මඟින් අදාළ වීම පුළුල් කිරීම වේ.

***18 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් VIIඅ වන කොටස ඇතුළත් කරනු ලැබේ. එම අලුත් කොටස මඟින් පරිගණක අපරාධ සම්බන්ධයෙන් වන ගබඩා කළ දත්ත කඩිනමින් සුරක්ෂිත කිරීම සඳහා විධිවිධාන සලසනු ලැබේ.

***19 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියට 21අ සහ 21ආ යන අලුත් වගන්ති ඇතුළත් කරනු ලැබේ. එම අලුත් වගන්ති මඟින් සහාය ලබා දීමේ දී අදාළ වන අන්‍යෝන්‍යතාව සහ අන්තර් හුවමාරුව පිළිබඳ මූලධර්ම සහ ඉල්ලීම් ඉංග්‍රීසි භාෂාවෙන් ලැබිය යුතු බවට වන විධිවිධාන සලසනු ලැබේ.

***20 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලබන අතර ප්‍රතියෝජිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) "පොදු රාජ්‍ය මණ්ඩලීය රට" සහ "පොදු රාජ්‍ය මණ්ඩලයට අයත් නොවන රට" යන යෙදුම්හි අර්ථ නිරූපණ පරිච්ඡින්න කිරීම;

(ආ) "නිසි බලධරයා" සහ "සාපරාධී කාරණය" යන යෙදුම්හි අර්ථ නිරූපණ සංශෝධනය කිරීම;

(ඇ) "බ්ලොක්චේන් තාක්ෂණය", "නියමිත බලධරයා", "පරිගණක දත්ත", "පරිගණක පද්ධතිය", "පාලිත මෙහෙයුම්", "රට" හෝ "විදේශීය රාජ්‍යය", "ඩිජිටල් ව්‍යවහාර මුදල්", "ලේඛනය", "විදේශීය රාජ්‍ය නිලධරයා", "ක්‍රියා විරහිත කිරීම", "අමාත්‍යවරයා", "පොදු ජාත්‍යන්තර සංවිධානයක නිලධරයා", "අපරාධ මඟින් උපයාගත් දේ", "දේපළ", "පොදු ජාත්‍යන්තර සංවිධානය" සහ "හුවමාරුවන දත්ත" යන යෙදුම් සඳහා අලුත් අර්ථ නිරූපණ ඇතුළත් කිරීම,

වේ.

***21 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තිය, සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක්, යම් දැන්වීමක්, නිවේදනයක්, ගිවිසුමක්, සන්නිවේදනයක් හෝ වෙනත් යම් ලේඛනයක් සංශෝධනය කරනු ලබන අතර එම සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ "නිශ්චිත රට" යන්නෙන් "නිශ්චිත රට හෝ නිශ්චිත සංවිධානය" අදහස් කරනු ලබන ලෙස තේරුම් ගැනීම සඳහා පනත අදාළ වීම පුළුල් කිරීම වේ.

***22 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ප්‍රතියෝජනය කරනු ලබන අතර, ප්‍රතියෝජිත පරිදි වූ එම උපලේඛනයේ නීතිය බලපෑම වනුයේ අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීම පිළිබඳ ඉල්ලීම සඳහා අලුත් පොදු ආකෘති පත්‍රයක් හඳුන්වා දීම වේ.

## සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන)

එල්.ඩී.—ඕ. 67/2016

**2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2018 අංක ............ දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2002 අංක 25 දරන පනතේ 2 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"පනත අදාළ වීම.

2. (1) *ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක්* මඟින් අමාත්‍යවරයා විසින් මේ පනතේ විධිවිධාන-

(අ) මේ පනත ආරම්භ වීමට පෙර හෝ ඉන්පසුව ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු වන්නා වූ,සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීම සම්බන්ධයෙන් වන යම් ජාත්‍යන්තර හෝ කලාපීය සම්මුතියක හෝ වෙනත් ගිවිසුමක පාර්ශ්වයක් වන්නා වූ සෑම රටක්;

(ආ) සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීම සඳහා ශ්‍රී ලංකාව සමග යම් ගිවිසුමකට ඇතුළත් වී ඇති යම් රටක්;

(ඇ) ශ්‍රී ලංකාව සහාය ලබා දීම සහ සහය ලබා ගැනීම, ස්වෛරී ජාතීන්ගේ උපරිම ශුභසිද්ධිය උදෙසා හේතු වන්නේ යයි අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි,

ශ්‍රී ලංකාව සමග කිසිදු ගිවිසුමකට එළඹ නොමැති යම් රටක්;

(ඈ) ජාත්‍යන්තර සාපරාධී කාරණාවලට එරෙහිව ක්‍රියාකරන, ඒ හා ආශ්‍රිත යම් සංවිධානයක්,

සඳහා අවශ්‍ය විය හැකි යයි සලකනු ලබන යම් නියම සහ කොන්දේසි මත සහ අන්තර් හුවමාරුව සහතික කිරීම මත පදනම්ව අදාළ විය යුතු බවට ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) මේ වගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම, එය සාදන ලද්දේ යම් ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන් නම්, ඒ ගිවිසුමේ කොන්දේසි සමග කියවිය යුතු ය. එම නියමය *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ දිනයේ සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු අතර, එම නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් දක්වා හෝ එය සාදන ලද්දේ යම් ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන් ද ඒ ගිවිසුම බලාත්මකව පවත්නා තාක් කල් ඒ නියමය බලාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියමයක් ම *ගැසට් පත්‍රයේ* පළකරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ යම් නියමයක්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) නියමයක් පරිච්ඡින්න කරනු ලැබූ දිනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

(5) තත්කාලයේ බලපවත්නා වූ සහ යම් නියමයක් සාදනු ලැබ ඇත්තේ යම් රටක් හෝ සංවිධානයක් සම්බන්ධයෙන් ද, එවැනි සෑම රටක් ම හා සංවිධානයක් ම මෙහි මින් මතු ''නිශ්චිත රට හෝ නිශ්චිත සංවිධානය'' වශයෙන් හඳුන්වනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"පනතේ අරමුණ.

3. (1) (අ) සාක්ෂිකරුවන් හෝ සැකකරුවන් සිටින ස්ථාන සහ ඔවුන් හඳුනා ගැනීම;

(ආ) ලේඛන භාරදීම;

(ඇ) සාක්ෂිකරුවන් හෝ සැක සහිත පුද්ගලයන් පරීක්ෂා කිරීම සහ ප්‍රශ්න කිරීම;

(ඈ) සාක්ෂි, ලේඛන, වෙනත් භාණ්ඩ හෝ තොරතුරු ලබාදීම සහ ලබා ගැනීම;

(ඉ) සෝදිසි කිරීම සහ තහනමට ගැනීම සඳහා වූ ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම;

(ඊ) සාක්ෂිකරුවකු වශයෙන් පෙනී සිටීම සඳහා බන්ධනාගාරගත ව සිටින තැනැත්තකු තාවකාලිකව මාරුකිරීමක් සිදු කිරීම;

(උ) සාක්ෂිකරුවන් හට පෞද්ගලිකව පෙනී සිටීම සඳහා පහසුකම් සැලසීම;

(ඌ) ප්‍රකාශන අයිතිය උල්ලංඝනය කිරීම ද ඇතුළුව බුද්ධිමය දේපළ සාපරාධී ලෙස උල්ලංඝනය කිරීම;

(එ) යම් සාපරාධී ක්‍රියාවකට සම්බන්ධිත පරිගණක පද්ධතියක් හෝ වෙනත් යම් දේපළක් පිහිටි ස්ථාන පිළිබඳ තොරතුරු සම්ප්‍රේෂණය කිරීම;

(ඒ) දඩ ගෙවීම සඳහා වූ යම් නියමයන් බලාත්මක කිරීම;

(ඔ) එම කාරණාවලට අදාළ නීතිවලට අනුව සිදුකරන අහිමි කිරීම හෝ ක්‍රියාවිරහිත කිරීම;

(ඕ) ඕනෑම ඩිජිටල් ව්‍යවහාර මුදල් වෙළෙඳාම් කිරීම ද ඇතුළුව අන්තර්ජාලය, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, ක්ලවුඩ් පරිගණකකරණය, බ්ලොක්චේන් තාක්ෂණය සහ අනෙකුත් පරිගණක ජාල හරහා සිදුකරනු ලබන අපරාධ අනාවරණය කර ගැනීම;

(ක) යම් විදේශීය රාජ්‍ය නිලධරයකුගේ හෝ පොදු ජාත්‍යන්තර සංවිධානයක නිලධරයකුගේ අල්ලස් ගැනීම සහ ඔවුන්ගේ නියෝජිත පෙරකලාසිලාභීන් සහ අර්ථලාභීන්ගේ අල්ලස් ගැනීම;

(ග) ගබඩා කළ පරිගණක දත්ත කඩිනමින් සුරක්ෂිත කිරීම සහ සුරක්ෂිත කළ හුවමාරුවන දත්ත සහ රඳවාගත් දත්ත කඩිනමින් අනාවරණය කිරීම;

(ච) යම් සාපරාධී ක්‍රියාවක් මඟින් උපයාගත් දේ තිබෙන ස්ථාන සොයා ගැනීම;

(ජ) නිශ්චිත රටක දී, විශේෂිත බලය පැවරීමක් මඟින් අධිකරණමය නඩු කටයුත්තකට ආවේශ්‍ය කරගැනීමට

ලබාගත් ලේඛනගත සාක්ෂි භාවිත කිරීම; සහ

(ට) වීඩියෝ සංවාද තාක්ෂණය ඔස්සේ නිශ්චිත රටක සිට මෙහෙය වූ සාක්ෂි ආවේශ්‍යතාව සහ අදාළ කරගැනීම,

යන කාරණා ද ඇතුළුව සාපරාධී සහ ඒ ආශ්‍රිත කාරණාවල දී ශ්‍රී ලංකාව විසින් සහය ලබාදීම හා ලබාගැනීම පිළිබඳ පහසුකම් සැලැස්වීම මේ පනතේ අරමුණ වේ.

(2) විදේශීය රාජ්‍යය හෝ සංවිධානවල සාපරාධී කාරණාවලට අදාළව අධිකරණමය නඩු කටයුතු සම්බන්ධයෙන් වන විමර්ශන සඳහා වෙනත් යම් ආකාරයක හෝ ස්වභාවයක සහාය ලබාදීම මෙම පනත මඟින් බැහැර නොකළ යුතු ය. එම සහාය ලබාදීම යන්නට පාලිත මෙහෙයුම් සඳහා ද, ඒකාබද්ධ විමර්ශන සිදු කිරීම ද, අපරාධ නඩු කටයුතු වෙනත් උසාවියකට පැවරීම සහ බහුවිධ සෝදිසි ක්‍රමවේදයන් ඇතුළුව වෙනත් විශේෂ විමර්ශන උපක්‍රම යොදා ගැනීම ද ඇතුළත් විය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්ති ආදේශ කරනු ලැබේ:-

"මධ්‍යම බලධරයා විසින් පනතේ කටයුතු පරිපාලනය කළ යුතු බව.

4. (1) (මෙහි මින් මතු "මධ්‍යම බලධරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා, මේ පනතේ කාර්යය සඳහා මධ්‍යම බලධරයා වන්නේ ය.

(2) මධ්‍යම බලධරයා විසින්, මෙම පනතේ කාර්යය සඳහා මධ්‍යම බලධරයා වෙනුවෙන් කටයුතු කිරීමට ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුගේ තනතුරකට පහළ නොවන තනතුරක් දරන වෙනත් යම් නිලධරයකු වෙත ලිඛිතව බලය පවරනු ලැබිය හැකි ය.

(3) මධ්‍යම බලධරයා විසින් විධාන කළ පරිදි ඉල්ලීමට අදාළ තොරතුරු පිළියෙල කරනු ලැබිය

යුතු නියමිත බලධරයන් මධ්‍යම බලධරයා විසින් නම් කළ යුතු ය.

(4) ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම, අයහපත් සෞඛ්‍ය තත්ත්වය හෝ යම් වරදක් සඳහා වරදකරුවකු බවට පත්වීම යන හේතු මත ස්වකීය කාර්යය ඉටුකිරීමට මධ්‍යම බලධරයා අපොහොසත් වන අවස්ථාවක දී අමාත්‍යවරයා විසින් එම නොහැකියාවට පත්වීමේ දින සිට දින තුනක් ඇතුළත පනත පරිපාලනය කිරීම පිණිස ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුගේ තනතුරකට පහළ නොවන යම් තනතුරක් දරන යම් නිලධරයකු පත්කරනු ලැබිය යුතු ය.

මධ්‍යම බලධරයාගේ කාර්යය සහ කර්තව්‍ය.

4අ. මධ්‍යම බලධරයා විසින්-

(අ) අවශ්‍ය පරිදි වෙනත් යම් ආස්ථිත්‍යයන්ගේ හෝ තැනැත්තන්ගේ ද සහාය ඇතිව සියලු ඉල්ලීම්වලට වහාම ක්‍රියාමාර්ග ගැනීම සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු සාධාරණ පියවර ගනු ලැබිය යුතු ය;

(ආ) 5 වන වගන්තිය යටතේ ලද ඉල්ලීමක් අවශ්‍ය තොරතුරු හෝ සහාය ලබාදීම සඳහා යම් නියමිත බලධරයකු වෙත විධාන කරනු ලැබිය හැකි ය;

(ඇ) හදිසි ඉල්ලීම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුතු ය;

(ඈ) අදාළ දේශීය හා විදේශීය බලධරයන් සම්බන්ධ කරගැනීමේ තොරතුරු පවත්වාගෙන යා යුතු ය;

(ඉ) ලැබෙන සහ යවන ඉල්ලීම් කළමනාකරණය කිරීම සඳහා නිසි ක්‍රමවේදයක් පවත්වාගෙන යාම සඳහා ම වෙන් වූ ඒකකයක් පවත්වාගෙන යා යුතු ය; සහ

(ඊ) පනතේ විධිවිධාන පරිපාලනය කිරීම සඳහා වන නිර්ණායක හා චක්‍රලේඛ නිකුත් කළ හැකි ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්ති ආදේශ කරනු ලැබේ:-

''නිශ්චිත රටක් හෝ නිශ්චිත සංවිධානයක් විසින් කරනු ලබන ඉල්ලීම.

5. (1) යම් නිශ්චිත රටක හෝ යම් නිශ්චිත සංවිධානයක නිසි බලධරයා විසින් මේ පනතේ සඳහන් යම් සාපරාධී සහ ඒ හා ආශ්‍රිත කාරණා සම්බන්ධයෙන් වන තොරතුරු හෝ සහාය ඉල්ලමින් මධ්‍යම බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය. එම රට තුළ හෝ ඉන් පිටත යම් සාපරාධී ක්‍රියාවක් වළක්වා ගැනීම, අනාවරණය කර ගැනීම, ඒ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම හෝ නඩු පැවරීම සඳහා එකී තොරතුරු ලබාගත යුතු ය.

(2) එකී ඉල්ලීම මේ පනතේ උපලේඛනයෙහි දක්වා ඇති ආකෘතියෙහි සාරානුකූලව කරනු ලැබිය යුතු අතර 5අ වගන්තිය යටතේ වහාම ක්‍රියාමාර්ග ගැනීමට ඉඩ සැලසීම සඳහා මධ්‍යම බලධරයා විසින් ඒ කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි ආකාරයේ ලේඛන ඒ ඉල්ලීම සමග එවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල වන්නා වූ යම් ඉල්ලීමක් යම් නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක නිසි බලධරයා මඟින් සෘජුවම ඉලෙක්ට්‍රොනික මාධ්‍යයක් මඟින් අදාළ නියමිත බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. (4) වන උපවගන්තියට යටත්ව, එකී නියමිත බලධරයා විසින් වහාම එම ඉල්ලීම ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ නියමිත බලධරයකු වෙත සෘජුවම ඉල්ලීමක් කරනු ලැබූ විට දී, එකී නියමිත බලධරයා විසින් අදාළ ඉල්ලීමෙහි පිටපතක් ඉදිරිපත් කරමින් මධ්‍යම බලධරයා වෙත ඒ පිළිබඳව වහාම දැන්විය යුතු ය.

(5) මේ වගන්තිය යටතේ සිදු කරනු ලැබූ ඉල්ලීමක් මත මධ්‍යම බලධරයා විසින් නියමිත බලධරයා වෙත යොමුකරන ලද සහාය හෝ තොරතුරු, යම් නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක නිසි බලධරයා වෙත සෘජුවම-

(අ) මධ්‍යම බලධරයා විසින්; හෝ

(ආ) අදාළ නියමිත බලධරයා විසින්,

සම්ප්‍රේෂණය කරනු ලැබිය යුතු අතර, එකී නියමිත බලධරයා විසින් ඉල්ලීම සම්පූර්ණ කිරීම පිළිබඳව හෝ ලබා ඇති ප්‍රගතිය පිළිබඳව මධ්‍යම බලධරයා වෙත වාර්තා කරනු ලැබිය යුතු ය.

(6) ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක් විසින්, යම් නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක නිසි බලධරයාගෙන් යම් ඉල්ලීමක් සෘජුවම මධ්‍යම බලධරයාට නොලැබුණු බවට වන හේතු මත එකී ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු නොලැබිය හැකි ය.

ඉල්ලීම්වලට වහාම ප්‍රතිචාර දැක්විය යුතු බව.

5අ. (1) යම් ඉල්ලීමක් ලැබුණ විට දී මධ්‍යම බලධරයා විසින් එය අනුමත කිරීම, අඩ වශයෙන් අනුමත කිරීම, අවශ්‍ය වනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව අනුමත කිරීම, එකී ඉල්ලීම කල් දැමීම හෝ ප්‍රතික්ෂේප කිරීම හැකිතාක් ඉක්මනින් සිදු කරනු ලැබිය හැකි ය.

(2) යම් ඉල්ලීමක් ලැබුණු විට දී, මධ්‍යම බලධරයා විසින් වහාම-

(අ) එම ඉල්ලීමට අදාළව තොරතුරු පිළියෙල කිරීමට යම් නියමිත බලධරයකුට විධාන කිරීම;

(ආ) (i) එම ඉල්ලීම ක්‍රියාත්මක කිරීමේ දී ලත් ප්‍රතිඵලය හේතු සහිතව;

(ii) එම ඉල්ලීම ක්‍රියාත්මක කිරීමට නොහැකි තත්ත්වයකට පමුණුවන හෝ එය සැලකිය යුතු ලෙසින් ප්‍රමාද විය හැකි යම් හේතු,

නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක නිසි බලධරයාට දැනුම් දීම,

සිදු කරනු ලැබිය යුතු ය.

**නිරායාසයෙන් තොරතුරු සම්ප්‍රේෂණය කිරීම.**

5ආ. අන්තර් හුවමාරුව සහතික කිරීම සහ රහසිගතභාවයේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් කොන්දේසි මත, යම් නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක නිසි බලධරයා වෙත යම් සාපරාධී කාරණාවකට අදාළව ඉල්ලා ඇති තොරතුරු නිරායාසයෙන් සම්ප්‍රේෂණය කිරීම සඳහා නිසි බලධරයකු වෙත මධ්‍යම බලධරයා විසින් විධාන කිරීම මෙම පනතේ කිසිවක් මඟින් වළක්වනු නොලැබිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.**

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඇ) සාපරාධී කාරණාවක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට එරෙහිව නඩු පැවරීමකට අදාළ යම් ඉල්ලීමක්, එම වරද සම්බන්ධයෙන් හෝ එම වරද සංයුක්ත වන ක්‍රියාවෙන්ම හෝ නොකර හැරීමෙන් ම සංයුක්ත වන වෙනත් වරදක් සම්බන්ධයෙන්-

(i) සාපරාධී කටයුතු පිළිබඳ විමර්ශන හෝ නඩු කටයුතු, ශ්‍රී ලංකාව තුළ ආරම්භ වී ඇත්තේනම්; හෝ

(ii) ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව එකී තැනැත්තා නිදොස් කරනු ලැබ ඇත්තේ නම් හෝ වරදකරු කරනු ලැබ ඇත්තේ නම්; හෝ".

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය එම ප්‍රඥප්තියේ 6අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු යः- ප්‍රධාන ප්‍රඥප්තියට 6අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"රහසිගතභාවය. 6අ. (1) 4 වන වගන්තිය යටතේ සඳහන් කරනු ලබන සෑම නිලධරයකු විසින් ම සියලු කරුණු දැඩිව රහසිගත වන බවට සලකනු ලැබිය යුතු ය.

(2) නීතිය මඟින් අන්‍යාකාරයකින් බලය පවරනු ලබන්නේ නම් මිස, ස්වකීය නිල බලය හෝ ධුරය හේතුවෙන් සහ ඉල්ලීමේ රහසිගත ස්වාභාවය පිළිබඳව දැනුවත්ව-

(අ) මේ පනත යටතේ සිදු කරනු ලැබූ යම් ඉල්ලීමක අන්තර්ගතය;

(ආ) එවැනි ඉල්ලීමක් සිදු කරනු ලැබ ඇති බව හෝ සිදු කිරීමට නියමිතව ඇති බව; හෝ

(ඇ) එවැනි ඉල්ලීමක් සඳහා අවසරය ලබා ඇති හෝ ප්‍රතික්ෂේප කර ඇති බව,

දන්නා යම් තැනැත්තකු විසින් විදේශීය ඉල්ලීමක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍යවන ප්‍රමාණයට හැර එකී අන්තර්ගතය හෝ කරුණු අනාවරණය නොකළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි රහසිගතභාවය ආරක්ෂා කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී යම් ඉල්ලීමක් සඳහා අනුකූලතාවය දැක්වීම පිණිස ඒ පිළිබඳව මධ්‍යම බලධරයා වෙත වහාම දැනුම් දිය යුතු අතර මධ්‍යම බලධරයා විසින් ඉන්පසුව යම් නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක නිසි බලධරයා වෙත ඒ සම්බන්ධයෙන් දැන්විය යුතු අතර එවිට එම නිශ්චිත රටේ හෝ නිශ්චිත සංවිධානයේ නිසි බලධරයා විසින්

එසේ වුව ද, එම ඉල්ලීම ක්‍රියාත්මක කළ යුත්තේ ද යන්න නිශ්චය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියට අනුකූලව ක්‍රියා කිරීමට අපොහොසත් යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරන අතර, අදාළ පළාතේ මහාධිකරණය විසින් වරදකරු කිරීම මත, අනනුකූලතාවයේ ස්වභාවය සහ බරපතළකම පිළිබඳව සැලකිලිමත් වෙමින් රුපියල් එක් ලක්ෂයක් ඉක්මවන්නා වූ දඩයකට යටත්වනු ලැබිය යුතු ය. එසේ වුව ද, එකී දඩය, කිසිදු අවස්ථාවක දී, රුපියල් මිලියන පහක මුදලක් නොඉක්මවිය යුතු ය.

(5) මේ පනතේ කාර්යය සඳහා, යම් සාපරාධී කටයුත්තකට අදාළ තොරතුරු සඳහා වන ඉල්ලීමකට, ඉල්ලීම සිදු කරනු ලබන තැනැත්තාගේ සැබෑ බව තහවුරු කිරීමෙන් පසුව, අවසර ලබා දිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) ශ්‍රී ලංකාවේ අපරාධ නඩු අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළතට වැටෙන යම් සාපරාධී කාරණයකට සම්බන්ධ වී ඇතැයි සැක කරනු ලැබූ හෝ සාක්ෂි දීමට හෝ සහාය දීමට හැකියාව ඇත්තා වූ යම් තැනැත්තකු-

(අ) නිශ්චිත රටක සිටී යයි විශ්වාස කිරීමට තරම් සාධාරණ හේතු ඇති අවස්ථාවක, මධ්‍යම බලධරයා විසින් ස්වකීය ස්වාභිමතය අනුව හෝ නියමිත බලධරයකුගේ ඉල්ලීම මත ඒ තැනැත්තා සොයා ගැනීමට යම් නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක නිසි බලධරයාගේ සහාය ඉල්ලා සිටිනු ලැබිය යුතු ය;

(ආ) එකී තැනැත්තාගේ අනන්‍යතාව නොදන්නා අවස්ථාවකදී, මධ්‍යම බලධරයා විසින් ස්වකීය අභිමතය අනුව හෝ නියමිත බලධරයාගේ ඉල්ලීම මත, එම තැනැත්තන් හා සම්බන්ධ වන බවට විශ්වාස කළ හැකි යම් තැනැත්තන්ගෙන්-

(i) ප්‍රශ්න කිරීම;

(ii) ප්‍රකාශ වාර්තාගත කිරීම;

(iii) ලේඛන හෝ භාණ්ඩ ලබාගැනීම,

සඳහා නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක නිසි බලධරයාගෙන් ඉල්ලුම් කරනු ලැබිය හැකි අතර, එම තොරතුරු මධ්‍යම බලධරයා වෙත යොමු කිරීමට අවශ්‍ය වේ. මධ්‍යම බලධරයා විසින්, අවශ්‍ය වන අවස්ථාවල දී, එම තොරතුරු අදාළ නියමිත බලධරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය. නිසි බලධරයා විසින් ලබාගන්නා ලද ලේඛන හෝ භාණ්ඩ පැහැදිලිව ලකුණු කරනු ලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :-

"(4) 10 වන සහ 21 වන වගන්තිවලට යටත්ව, (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි තැනැත්තකුගෙන් ප්‍රශ්න කිරීම සහ ඔහුගේ ප්‍රකාශයක් වාර්තාගත කිරීම, ශ්‍රී ලංකාවේ නීතිය බලාත්මක කිරීමේ බලධරයකු හෝ නිසි බලධරයකු විසින් පත්කරනු ලැබිය හැකි නීතිය බලාත්මක කිරීමේ බලධරයකු හෝ උක්ත නීතිය බලාත්මක කිරීමේ බලධරයින්ගෙන් සමන්විත කණ්ඩායමක් විසින් සිදු කරනු ලැබිය යුතු ය.";

(3) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කිරීමෙන් සහ පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :-

"තැනැත්තන්
සොයාගැනීමේ දී
හා හඳුනාගැනීමේ දී
අන්තර් ජාතික
සහාය ලබා දීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) මධ්‍යම බලධරයා විසින්-

(අ) ඒ රටේ අපරාධ නඩු කටයුතුවල දී විත්තිකරුවකු වශයෙන් පෙනී සිටීම හෝ සාක්ෂිකරුවකු වශයෙන් පැමිණීම සඳහා තැනැත්තකුට නියම කෙරෙන සිතාසි හෝ වෙනත් අධිකරණ විධානයක්;

(ආ) ඒ රටේ අපරාධ අධිකරණ බලය ක්‍රියාත්මක කෙරෙමින් හා ඒ අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී දෙන ලද අධිකරණ තීන්දුව සටහන් කෙරෙමින් අධිකරණයක් විසින් නිකුත් කරන ලද ලේඛනයක්,

භාරදීම සඳහා නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක නිසි බලධරයකුගෙන් ලද ඉල්ලීමක් අනුමත කරනු ලබන අවස්ථාවක දී, ඒවා භාරදීම සඳහා මධ්‍යම බලධරයා විසින් එම අධිකරණයේ තීරණය සමග එකී ඉල්ලීම එම තැනැත්තා ශ්‍රී ලංකාවේ වාසය කරන අධිකරණ බලසීමාව ඇතුළත වූ මහෙස්ත්‍රාත් අධිකරණයේ මහෙස්ත්‍රාත්වරයා වෙත වහාම යොමු කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "මධ්‍යම බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක" සිට එම ඡේදයේ අවසානය දක්වා වූ සියලු වචන

ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"මධ්‍යම බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක, මධ්‍යම බලධරයා විසින් ඒ සාක්ෂි ගැනීම සඳහා හෝ ඒ ලේඛන හෝ භාණ්ඩ භාරගැනීම සඳහා එකී ඉල්ලීම නියමිත බලධරයකුට හෝ අවශ්‍ය විට දී, කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ ප්‍රධාන මහෙස්ත්‍රාත්වරයා වෙත වහාම යොමු කළ යුතු අතර, ඒ සාක්ෂි, ලේඛන හෝ භාණ්ඩ, අවස්ථාවෝචිත පරිදි, ඒ මහෙස්ත්‍රාත්වරයාගෙන් හෝ ඒ නියමිත බලධරයාගෙන් ලැබුණු විට, ඒවා නිශ්චිත රටේ හෝ නිශ්චිත සංවිධානයේ නිසි බලධරයා වෙත යවනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"නිශ්චිත රටක දී හෝ නිශ්චිත සංවිධානයක දී සාක්ෂි ගැනීම හා ලේඛන ආදිය ඉදිරිපත් කිරීම සඳහා මධ්‍යම බලධරයා විසින් කරනු ලබන ඉල්ලීම.

11. (1) මධ්‍යම බලධරයා විසින් යම් අධිකරණයක හෝ නියමිත බලධරයකුගේ ඉල්ලීමක් මත, සාපරාධී කාරණාවක් පිළිබඳව විමර්ශන සිදුකිරීමේ සහ සාපරාධී කාරණාවක් පිළිබඳ නඩු කටයුත්තක කාර්යය සඳහා,

(අ) පරිගණක සාක්ෂි ඇතුළු ව සාක්ෂි ලබා ගැනීම;

(ආ) විමර්ශන ද්‍රව්‍ය ඉදිරිපත් කිරීම;

(ඇ) බැංකු ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම; හෝ

(ඈ) වෙනත් යම් ලේඛන හෝ වෙනත් භාණ්ඩ ඉදිරිපත් කිරීම,

සඳහා කටයුතු පිළියෙල කරන ලෙස නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක නිසි බලධරයාගෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මධ්‍යම බලධරයා විසින් සිදු කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන් නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක නිසි බලධරයාගෙන්, -

(අ) ගනු ලැබූ යම් සාක්ෂියක් සහ එකී සාක්ෂිය පරිගණක සාක්ෂි සම්බන්ධයෙන් අදාළ වන විට දී, සත්‍ය පිටපතක් බවට යම් අධිකරණ බලධරයෙක් හෝ නිසි බලධරයෙක් විසින් සහතික කිරීම මත, එකී සාක්ෂිය;

(ආ) 21 වන වගන්තිය යටතේ යථා පරිදි සැබෑ බවට සහතික කරන ලද, එකී නිශ්චිත රටේ දී නිශ්චිත සංවිධානයේ දී ඉදිරිපත් කරනු ලැබූ විමර්ශන ද්‍රව්‍යයක්, බැංකු ප්‍රකාශයක්, වෙනත් යම් ලේඛනයක් හෝ වෙනත් යම් භාණ්ඩයක්,

මධ්‍යම බලධරයා වෙත ලැබුණු විට දී, ඒ ඉල්ලීම අදාළ වන්නා වූ යම් නඩු කටයුත්තක දී එය ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ ලැබුණු කිසිදු තොරතුරක්, ඒ නිසි බලධරයාගේ ලිඛිත කැමැත්ත නොමැතිව, ඒ ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කරන ලද සාපරාධී කාරණාව පිළිබඳ කාර්යය නොවන යම් කාර්යයක් සඳහා භාවිත කරනු නොලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "බලය දෙන ලද ලෙස සලකනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "ප්‍රමාණවත් බලය ලබා දීමක් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "කාලය දී ඇති පරිද්දෙන් සලකනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "ප්‍රමාණවත් බලය ලබා දීමක් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට 13අ සහ 13ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර එකී වගන්ති එම ප්‍රඥප්තියේ 13අ සහ 13ආ වගන්ති වශයෙන් බලාත්මක විය යුතු යඃ-

"වීඩියෝ සංවාද තාක්ෂණය සඳහා පහසුකම් සැලසීම.

13අ. මේ පනත යටතේ තැනැත්තකු හෝ දෙයක් හෝ වෙනත් යම් ආකාරයක සහායක් හඳුනාගැනීම සඳහා වාචික සාක්ෂි අවශ්‍ය වන බවට යම් අධිකරණයක් විසින් හෝ නියමිත බලධරයකු විසින් සලකනු ලබන අවස්ථාවක දී, ඒ අධිකරණය හෝ නියමිත බලධරයා විසින්, විදේශීය රාජ්‍යයක භෞතිකව සිටින සහ ශ්‍රී ලංකාවේ අධිකරණයට පැමිණීමට නොහැකි සාක්ෂිකරුවකුගෙන් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකට සාක්ෂි මෙහෙයවීම සඳහා වීඩියෝ හෝ ශ්‍රවණ සම්ප්‍රේෂණ තාක්ෂණය භාවිත කරනු ලැබිය හැකි ය. අධිකරණ නිලධරයකු විසින් හෝ නීතිය බලාත්මක කිරීමේ නිලධරයකු විසින් ඍජුවම විභාගය පවත්වනු ලැබිය යුතු ය.

ඒකාබද්ධ විමර්ශන.

13ආ. විවිධ රටවල සිටින තැනැත්තන් සම්බන්ධ වෙමින් හෝ විවිධ රටවල පිහිටා තිබෙන දේපළ සම්බන්ධයෙන් යම් වරදක් සිදුකර ඇති අවස්ථාවක යම් ඉල්ලීමක් සිදු කර ඇත්තේ නම්, මධ්‍යම බලධරයා විසින් ශ්‍රී ලංකාවේ සහ නිශ්චිත රටවල හෝ නිශ්චිත සංවිධානවල විමර්ශකයන්ගෙන් සමන්විත ඒකාබද්ධ විමර්ශනයක් ස්ථාපිත කිරීමට අදාළ විධිවිධාන සලසනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් Vඅ වන කොටස ඇතුළත් කිරීම.

**15.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් කොටස (14අ සහ 14ආ වගන්ති) මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ Vඅ වන කොටස වශයෙන් බලාත්මක විය යුතු යඃ-

"Vඅ වන කොටස

**විදේශීය රාජ්‍ය නිලධරයකුගේ හෝ පොදු ජාත්‍යන්තර සංවිධානයක නිලධරයකුගේ අල්ලස් ගැනීම් සම්බන්ධයෙන් වන සහාය**

විදේශීය නිලධරයකු සම්බන්ධ අල්ලස් ගැනීම් හඳුනාගැනීම යනාදිය සඳහා නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක ඉල්ලීම.

14අ. විදේශීය රාජ්‍ය නිලධරයකු හෝ පොදු ජාත්‍යන්තර සංවිධානයක යම් නිලධරයකු අල්ලස් ගැනීම්වලට සම්බන්ධ වී ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු සහිතව නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක නිසි බලධරයකු විසින් ඉල්ලීමක් සිදු කරනු ලබන අවස්ථාවක දී, එකී නිලධරයා හඳුනාගැනීමට හෝ සිටින තැන සොයා ගැනීමට හෝ එකී විදේශීය නිලධරයා, ඔහුගේ පෙරකලාසිකරුවන් සහ අර්ථලාභීන් සම්බන්ධ අල්ලස් ගැනීමෙන් උපයාගත් දේවල්වල වටිනාකම තක්සේරු කිරීමට සහ පිහිටි තැන සොයා ගැනීම පිණිස මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

විදේශීය නිලධරයකු සම්බන්ධ අල්ලස් ගැනීම් හඳුනාගැනීම යනාදිය සඳහා ශ්‍රී ලංකාවේ ඉල්ලීම.

14ආ. විදේශීය රාජ්‍ය නිලධරයකු හෝ පොදු ජාත්‍යන්තර සංවිධානයක යම් නිලධරයකු සම්බන්ධවීමෙන් (26 වන අධිකාරය වූ) අල්ලස් පනත යටතේ යම් වරදක් සිදු කරනු ලැබ ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇති අවස්ථාවක දී, එකී නිලධරයා හඳුනාගැනීම සහ සිටින තැන සොයා ගැනීම සහ එකී විදේශීය නිලධරයා, ඔහුගේ පෙරකලාසිකරුවන් සහ අර්ථලාභීන් සම්බන්ධ අල්ලස් ගැනීමෙන් උපයාගත් දේවල්වල වටිනාකම තක්සේරු කිරීම සහ තිබෙන තැන සොයා ගැනීම සිදු කරන ලෙස මධ්‍යම බලධරයා විසින් එකී විදේශීය නිලධරයා පදිංචිව සිටින යම් නිශ්චිත රටක හෝ සිටින නිශ්චිත සංවිධානයක නිසි බලධරයාගෙන් ඉල්ලීමක් සිදු කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"අපරාධ මගින් උපයාගත් දේ සොයා ගැනීම සඳහා නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක ඉල්ලීම.

17. (අ) යම් තැනැත්තකු විසින් නිශ්චිත රටක යම් බරපතළ වරදක් සිදු කර ඇති බවට චෝදනා කරනු ලැබ හෝ යම් බරපතළ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබ හෝ බරපතළ වරදක් සම්බන්ධයෙන් සාධාරණ හේතු මත සැක කරනු ලැබ ඇත්තා වූ ද;

(ආ) ඒ වරද සිදු කිරීමෙන් ඍජුවම හෝ වක්‍රව ලබාගෙන තිබෙන යම් දේපළක් ශ්‍රී ලංකාවෙහි තිබෙන බව විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්තා වූ,

සහ තිසි බලධරයා විසින් මධ්‍යම බලධරයාගෙන් සහාය ඉල්ලා සිටින අවස්ථාවක දී, යම් තැනැත්තකු හඳුනාගැනීමට, සිටින තැන සොයා ගැනීම සඳහා සහාය ලබා දීමට හෝ ඒ දේපළෙහි වටිනාකම තක්සේරු කිරීමට සහාය වීමට, මධ්‍යම බලධරයා විසින් අදාළ නීති බලාත්මක කිරීමේ බලධරයා වෙත නියම කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "සාපරාධී කාරණයක්" යන වචන වෙනුවට "සාපරාධී හෝ ඒ ආශ්‍රිත කාරණයක්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියට VIIඅ වන අලුත් කොටස ඇතුළත් කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස (20අ සිට 20ඊ දක්වා වන වගන්ති) මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ VIIඅ වන කොටස ලෙස බලාත්මක විය යුතු ය.

"VIIඅ වන කොටස

**පරිගණක අපරාධ සම්බන්ධයෙන් වන ගබඩා කළ දත්ත කඩිනමින් සුරක්ෂිත කිරීම**

අදාළ අමාත්‍යාංශයක ලේකම්වරයා විසින් දත්ත සුරක්ෂිත කිරීමට නියෝග කළ යුතු බව.

20අ. ගබඩා කළ පරිගණක දත්ත හෝ හුවමාරුවන දත්තවල කඩිනම් සුරක්ෂිත කිරීමක් සිදු කළ යුතු බවට මධ්‍යම බලධරයාගේ මතය වන්නා වූ අවස්ථාවක දී, 20ආ වන වගන්තිය යටතේ නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමාවක් සඳහා, අවස්ථාවෝචිත පරිදි, ගබඩා කළ පරිගණක දත්ත හෝ හුවමාරුවන දත්ත හෝ

එකී දත්ත දෙවර්ගය ම කඩිනමින් සුරක්ෂිත කිරීම බලාත්මක කිරීම සඳහා නියෝගයක් කළ යුතු බව මධ්‍යම බලධරයා විසින් අදාළ විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනුම් දිය යුතු ය.

**දත්ත සුරක්ෂිත කළ යුතු කාලසීමාව.**

20ආ. 20අ වන වගන්තිය යටතේ නියෝගයක් කරන ලද සියලු දත්ත අවම වශයෙන් අවුරුදු හයක කාලසීමාවක් දක්වා සුරක්ෂිත කරනු ලැබිය යුතු ය.

**සුරක්ෂිත කරනු ලබන ආකාරය.**

20ඇ. (1) ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙන් තොරතුරු ලබා දීම සඳහා වන ඉල්ලීමකට ඉක්මනින් අනුකූලව ක්‍රියා කිරීම සඳහා යම් ආයතනයකට හැකියාව ලබා දෙනු ලබන ආකාරයකින් සහ ආකෘතියකින් මෙම කොටස යටතේ සුරක්ෂිත දත්ත පිළිබඳ වාර්තා පවත්වාගෙන යා යුතු ය.

(2) වාර්තාවේ පිටපතක්,-

(අ) කියවිය හැකි ස්වරූපයකින් වන, මුද්‍රණයක් පහසුවෙන් ලබා ගැනීමට හැකියාව ඇති යන්ත්‍රයක තබාගත හැකි ය;

(ආ) වාර්තා තබා ගන්නා තැනැත්තාගේ ඉලෙක්ට්‍රොනික අත්සනක්, සත්‍ය බව තහවුරු කිරීම උදෙසා යොදවමින්, කියවිය හැකි පිටපතක් පහසුවෙන් ලබාගත හැකිවන ලෙස ඉලෙක්ට්‍රොනික ස්වරූපයකින් තබා ගත හැකි ය;

(ඇ) අවශ්‍ය අවස්ථාවක දී, ගබඩා කළ පරිගණක දත්ත ක්‍රියාවිරහිත කිරීමෙන් රඳවා තැබිය හැකි ය; හෝ

(ඈ) අවශ්‍ය වන්නේ නම්, යාවත්කාලීන කරනු ලැබිය හැකි ය.

**සුරක්ෂිත කළ දත්ත මුදා හැරීම.**

20ඈ. (1) නිසි බලධරයා විසින් යථා පරිදි සිදු කරන ලද ඉල්ලීමක් මත එම ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමාවක් සඳහා සාපරාධී කටයුතු පිළිබඳ විමර්ශනයක හෝ අධිකරණමය නඩු

කටයුතුවල කාර්යයන් සඳහා සුරක්ෂිත කළ දත්ත මුදා හරිනු ලැබිය යුතු ය.

(2) 20අ වන වගන්තිය යටතේ සිදු කරන ලද සෑම නියෝගයක ම කාලය, 20ආ වන වගන්තිය යටතේ නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමාව අවසන් වීමේ දී හෝ ඉල්ලීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලසීමාව අවසන් වීමේ දී, ඉකුත් විය යුතු ය.

(3) යම් විශේෂිත සන්නිවේදනයක් පිළිබඳ වූ හුවමාරුවන දත්ත සුරක්ෂිත කිරීම සඳහා වන ඉල්ලීමකට සහාය ලබා දීමේ ක්‍රියාවලියේ දී, වෙනත් රටක සේවා සැපයුම්කරුවකු ද සන්නිවේදන සම්ප්‍රේෂණය කිරීමේ දී සම්බන්ධවී සිටි බවට මධ්‍යම බලධරයා වෙත දැනුම් දෙනු ලැබ ඇති අවස්ථාවක දී, එම ඉදිරිපත් කිරීම සඳහා වන ඉල්ලීම ලැබීමට පෙර, එම සේවා සැපයුම්කරු සහ සන්නිවේදනය සම්ප්‍රේෂණය වන ලද මාර්ගය හඳුනාගැනීම සඳහා ප්‍රමාණවත් පරිදි හුවමාරුවන දත්ත යම් ප්‍රමාණයක් අනාවරණය කරන ලෙස මධ්‍යම බලධරයා විසින් අදාළ නියමිත බලධරයා වෙත උපදෙස් ලබා දිය යුතු ය.

ගබඩා කළ පරිගණක දත්ත ඉදිරිපත් කිරීම.

20ඉ. පරිගණක දත්තවල අවශ්‍යතාව පිළිබඳ යම් ලිඛිත නීතියකට යටත්ව සහ මේ පනතේ VI වන කොටසේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, සාපරාධී කාරණාවක් විමර්ශනය කිරීමට අවශ්‍ය පරිගණක දත්ත හෝ තොරතුරු සඳහා වන, නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක නිසි බලධරයකුගේ ඉල්ලීමක් මත මහෙස්ත්‍රාත්වරයා විසින්-

(අ) පරිගණක පද්ධතියක හෝ පරිගණක දත්ත ගබඩා මාධ්‍යයක ගබඩා කර ඇති යම් තැනැත්තකු සන්තකයේ හෝ ඔහුගේ පාලනය යටතේ ඇති නිශ්චිත පරිගණක දත්ත; සහ

(ආ) යම් සේවා සැපයුම්කරුවකු සන්තකයේ හෝ ඔහුගේ පාලනය යටතේ ඇති අවශ්‍ය සේවාදායක තොරතුරු,

ඉදිරිපත් කිරීමට හැකියාව ලබා දීම සඳහා ආඥාවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

**පරිගණක දත්ත සෝදිසි කිරීම සහ තහනමට ගැනීම.**

20ඊ. (1) නිශ්චිත රටක හෝ නිශ්චිත සංවිධානයක නිසි බලධරයකු විසින් කළ ඉල්ලීමක් මත යම් පරිගණක පද්ධතියක් හෝ එහි කොටසක් මෙන්ම පරිගණක දත්ත ගබඩා කර තැබිය හැකි යම් පරිගණක දත්ත ගබඩා මාධ්‍යයක් සෝදිසි කිරීමට හෝ අන්‍යාකාරයකින් ඊට ප්‍රවේශ වීමට, 15 වන වගන්තිය යටතේ අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, වරෙන්තුවක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (අ) පරිගණක පද්ධතියක් හෝ එහි කොටසක්, හෝ පරිගණක දත්ත ගබඩා මාධ්‍යයක් තහනමට ගැනීම හෝ අන්‍යාකාරයකින් සුරක්ෂිත කිරීමට;

(ආ) එම පරිගණක දත්තවල පිටපතක් සකස් කිරීමට සහ රඳවා තබා ගැනීමට;

(ඇ) අදාළ ගබඩා කළ පරිගණක දත්තවල විශ්වාසනීයභාවය පවත්වාගෙන යාමට; සහ

(ඈ) ප්‍රවේශ වූ පරිගණක පද්ධතිය තුළ වන පරිගණක දත්ත ප්‍රවේශ විය නොහැකි ලෙසට පත් කිරීමට හෝ ඉවත් කිරීමට,

අවශ්‍ය වූ විට, එම පරිගණකය හෝ පරිගණක පද්ධතිය පිහිටා ඇති බවට විශ්වාස කරනු ලබන අධිකරණ බලසීමාව ඇතුළත වන මහෙස්ත්‍රාත්වරයා විසින් නිකුත් කරනු ලැබූ සෝදිසි වරෙන්තුව මගින්, පොලිස් නිලධරයකුට හෝ වෙනත් යම්තැනැත්තකුට, බලය පවරනු ලැබිය හැකි ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියට 21අ සහ 21ආ යන අලුත් වගන්ති ඇතුළත් කිරීම.**

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එකී වගන්ති එම ප්‍රඥප්තියේ 21අ සහ 21ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු යː-

**"අන්‍යෝන්‍යතාව සහ අන්තර් හුවමාරුව පිළිබඳ මූලධර්ම.**

21අ. මේ පනතේ කාර්යය සඳහා අන්‍යෝන්‍යතාව සහ අන්තර් හුවමාරුව පිළිබඳ මූලධර්ම සෑමවිට දී ම පිළිපැදිය යුතු ය.

භාෂාව. 21ආ. මේ පනත යටතේ සහයෝගීතාව සඳහා වන ඉල්ලීම හා ඒ සමඟ ඇති ලේඛන, ඉංග්‍රීසි භාෂාවෙන් තිබිය යුතු ය.".

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අර්ථ නිරූපණය. 24. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"නිසි බලධරයා" යන්න,

(අ) නිශ්චිත රටක් සම්බන්ධව යෙදෙන විට, ඒ රටෙහි යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ සාපරාධී කාරණාවලදී සහයෝගීතාව දැක්වීම සඳහා වන ඉල්ලීම් භාරගැනීම සහ යැවීම සඳහා නම් කරනු ලැබ සිටින, කවර වූ හෝ ආකාරයකින් විස්තර කෙරෙන තැනැත්තා අදහස් වේ;

(ආ) නිශ්චිත සංවිධානයක් සම්බන්ධව යෙදෙන විට, සාපරාධී කාරණාවලදී සහයෝගීතාව දැක්වීම සඳහා වන ඉල්ලීම් භාර ගැනීම සහ යැවීම සඳහා නම් කරනු ලැබ සිටින, කවර හෝ ආකාරයකින් විස්තර කෙරෙන තැනැත්තා අදහස් වේ;

"බ්ලොක්චේන් තාක්ෂණය" යන්නෙන්, පොදු හෝ පෞද්ගලික විය හැකි, අවශ්‍ය අවසරය ඇතිව හෝ නොමැතිව, හෝ ගුප්ත (ක්‍රිප්ටෝ) ආර්ථික විද්‍යාවන් මගින් මෙහෙයවනු ලැබිය හැකි හෝ

එසේ නොවිය හැකි, විභාජිත, විමධ්‍යගත, හවුල් සහ පිටපත් කරන ලද ලෙජරයක් භාවිත කරනු ලබන විභාජිත ලෙජර් තාක්ෂණය අදහස් වේ. ලෙජරය මත වූ දත්ත ගුප්ත ලේඛනකරණය (ක්‍රිප්ටෝග්‍රෆි) සමඟින් ආරක්ෂා විය යුතු, නිත්‍ය සහ විගණනය කළ හැකි විය යුතු අතර සත්‍ය තොරතුරු සැපයිය යුතු ය;

"නියමිත බලධරයා" යන්නට, නීතිය බලාත්මක කිරීමේ බලධරයකු ඇතුළත් වේ;

"පරිගණක දත්ත" යන්නෙන්, පරිගණක පද්ධතියක් විසින් කර්තව්‍යයක් ඉටු කිරීමට සැලැස්වීමට යෝග්‍ය වැඩසටහනක් ද ඇතුළුව පරිගණක පද්ධතියක සැකසුම් කිරීම් සඳහා යෝග්‍ය ආකාරයකින් කරුණු, තොරතුරු හෝ සංකල්පවල යම් ඉදිරිපත් කිරීමක් අදහස් වේ;

"පරිගණක පද්ධතිය" යන්නට, 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතේ ඒ සඳහා ඇති අර්ථයම තිබිය යුතු ය.

"පාලිත මෙහෙයුම්" යන්නට,

(අ) නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධරයන්ගේ සහභාගීත්වයෙන් නියුතු;

(ආ) (i) බරපතළ වරදක් සඳහා තැනැත්තකුට එරෙහිව නඩු පැවරීමකට මෙහෙයවනු ලැබිය හැකි සාක්ෂි ලබාගැනීමේ;

(ii) සාපරාධී ක්‍රියාවකට හෝ දූෂිත හැසිරීමකට සම්බන්ධ යම් තැනැත්තකු අත් අඩංගුවට ගැනීමේ;

(iii) සාපරාධී ක්‍රියාවක් හෝ දූෂිත හැසිරීමක් ව්‍යාර්ථීකරණය කිරීමේ;

(iv) (i) වන, (ii) වන හෝ (iii) වන උපඡේදයන්හි සඳහන් වන යම් කාර්යයක් ඉටුකිරීම සඳහා පහසුකම් සැපයීමට සාධාරණව අවශ්‍ය වන්නා වූ කටයුත්තක් සිදුකරගෙන යාමේ,

කාර්යය සඳහා පවත්වනු ලබන;

(ඇ) එකී ක්‍රියාව ශ්‍රී ලංකාවේ වරදක් වන අවස්ථාවක දී නීතිය ක්‍රියාත්මක කිරීමේ නිලධරයාගේ හෝ වෙනත් යම් බලයලත් තැනැත්තකුගේ අධීක්ෂණයෙන් නියුතු,

මෙහෙයුමක් ඇතුළත් වේ;

"රට" හෝ "විදේශීය රාජ්‍යය" යන්නට, ඒ රටෙහි විජිතයක්, දේශභූමියක්, ආරක්ෂිත දේශයක් හෝ වෙනත් උපජීවී රටක් හෝ ඒ රටෙහි ලියාපදිංචි නැවක් හෝ ගුවන් යානයක් අදහස් වන අතර, මහජන චීන සමූහාණ්ඩුවේ හොංකොං විශේෂ පරිපාලන කලාපය ඊට ඇතුළත් වන සේ සැලකිය යුතු ය;

"සාපරාධී කාරණය" යන්නෙන්,-

(අ) සාපරාධී වරදක් සම්බන්ධ යම් නීතියක් උල්ලංඝනය කිරීම; සහ

(ආ) (i) වරදකරු කිරීම මත හෝ වරදකරු නොකිරීමේ පදනම මත යම් දේපළක් හෝ අපරාධය මගින් උපයාගත් දේ අහිමි කිරීම හෝ රාජසන්තක කිරීම;

(ii) මූල්‍යමය දණ්ඩනයක් නියම කිරීම හෝ අයකර ගැනීම;

(iii) අහිමි කරනු ලැබිය හැකි හෝ රාජසන්තක කරනු ලැබිය හැකි දේපළ සොයා ගැනීම, ක්‍රියා විරහිත කිරීම සහ රඳවා ගැනීමද,

ඇතුළුව සාපරාධී වරදකට අදාළ විමර්ශනයක්, නඩු පැවරීමක් හෝ අධිකරණමය නඩු කටයුත්තක් අදහස් වේ;

"ඩිජිටල් ව්‍යවහාර මුදල්" යන්නට-

(අ) (i) හුවමාරු කිරීමේ මාධ්‍යයක්, ගිණුම් ඒකකයක් හෝ වටිනාකම ගබඩාවක් ලෙස භාවිත කරන; සහ

(ii) වලංගු මුදල් ලෙස නිර්ණය විය නොහැකි,

වටිනාකම ඩිජිටල්ව නිරූපණය කිරීමක් ඇතුළත් වන අතර;

(ආ) (i) වලංගු මුදල්, බැංකු බැරකමක් හෝ ඩිජිටල් ව්‍යවහාර මුදලක් වෙනුවෙන් වෙළෙන්දකුගෙන් ලබාගත නොහැකි හෝ හුවමාරු කර ගත නොහැකි වටිනාකමකින් යුත්, ඥාතීත්වයක හෝ ත්‍යාග වැඩසටහනක කොටසක් ලෙස වෙළෙන්දකු විසින් කරනු ලබන ප්‍රදානයක් මඟින් වන ගනුදෙනුවක්; හෝ

(ii) ප්‍රකාශකයා විසින් හෝ ප්‍රකාශකයා වෙනුවෙන් නිකුත් කරන ලද සහ එම ප්‍රකාශකයා විසින් ම විකුණන ලද හෝ එම ක්‍රීඩා වේදිකාවේ දී ම ප්‍රදානය කරන ලද මාර්ගගත (ඔන්ලයින්) ක්‍රීඩාවක, ක්‍රීඩා වේදිකාවක හෝ ක්‍රීඩා පවුලක පමණක් ම භාවිත කරන ලද වටිනාකමකින් යුත් ඩිජිටල්ව නිරූපණය කිරීමක්,

ඇතුළත් නොවේ;

"ලේඛනය" යන්නට,-

(අ) පහත දේවලින් යමක් හෝ, එයින් යම් කොටසක්-

(i) ලිවීමක් ඇති යම් පත්‍රයක් හෝ වෙනත් ද්‍රව්‍යයක්;

(ii) සිතියමක්, සැලැස්මක්, සිත්තමක්, ඡායාරූපයක් හෝ ඒ හා සමාන දෙයක්;

(iii) සුදුසුකම්ලත් තැනැත්තන්ට අර්ථකථනයක් දීමට හැකියාවක් ඇති, අර්ථයක් ඇත්තා වූ ලකුණු, ඉලක්කම්, සංකේත හෝ සිදුරු සහිත යම් පත්‍රයක් හෝ වෙනත් ද්‍රව්‍යයක්;

(iv) වෙනත් යම් දෙයක හෝ උපකරණයක ආධාරය ඇතිව හෝ නැතිව ශබ්ද, ප්‍රතිරූප හෝ ලියවිලි ප්‍රතිනිෂ්පාදනය කළ හැකි යම් දෙයක් හෝ ද්‍රව්‍යයක්;

(v) යාන්ත්‍රිකව හෝ ඉලෙක්ට්‍රොනිකව තොරතුරු ගබඩා කර හෝ පටිගත කර ඇති යම් දෙයක්;

(vi) වෙනත් යම් තොරතුරු වාර්තාවක්; හෝ

(ආ) එවැනි යමක් සම්බන්ධව ඇති යම් පිටපතක්, ප්‍රතිනිෂ්පාදනයක් හෝ අනුපිටපතක්; හෝ

(ඇ) එවැනි පිටපතක, ප්‍රතිනිෂ්පාදනයක හෝ අනුපිටපතක යම් කොටසක්,

ඇතුළත් වේ;

"යථා පරිදි සැබෑ බවට සහතික කරන ලද" යන්න, ලේඛනයක් සම්බන්ධව යෙදෙන විට, 21 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි සැබෑ බවට සහතික කළ ලේඛනයක් අදහස් වේ;

"විදේශීය නීතියෙන් මුක්ති සහතිකය" යන්නෙන්, යම් නිශ්චිත රටක නිසි බලධරයා විසින් හෝ යම් නිශ්චිත රටක නීතිය යටතේ පොදුවේ හෝ නිශ්චිතව සඳහන් කරනු ලබන තැනැත්තන් වෙත, පොදුවේ හෝ යම් නිශ්චිත නීති කෘත්‍යයන් හී දී නැතහොත් පොදු හෝ නිශ්චිත අවස්ථාගත තත්ත්වයන් යටතේ, යම් නිශ්චිත ප්‍රශ්නයක් සඳහා පිළිතුරු ලබා දීමට හෝ යම් නිශ්චිත ලේඛනයක් ඉදිරිපත් කිරීමට නියම කරනු ලැබිය හැකි බව හෝ නොහැකි බව එම නිශ්චිත රටෙහි නීතිය යටතේ සහතික කරමින් හෝ ප්‍රකාශයට පත් කරමින් ලබා දෙනු ලබන සහතිකයක් හෝ කරනු ලබන ප්‍රකාශයක් අදහස් වේ;

"විදේශීය රාජ්‍ය නිලධරයා" යන්නෙන්,-

(අ) විදේශීය රාජ්‍ය ආයතනයක සේවකයෙක් හෝ නිලධරයෙක්; හෝ

(ආ) ගිවිසුමක් යටතේ විදේශීය රාජ්‍ය ආයතනයක් වෙනුවෙන් සේවය ඉටු කරන තනි පුද්ගලයෙක්; හෝ

(ඇ) විදේශීය රාජ්‍යයක හෝ විදේශීය රාජ්‍යයක කොටසක නීතියක් යටතේ පත්කිරීමක,

ධුරයක හෝ තනතුරක වගකීම් දරන හෝ ඉටු කරනු ලබන තනි පුද්ගලයෙක්; හෝ

(ඈ) විදේශීය රාජ්‍යයක හෝ විදේශීය රාජ්‍යයක කොටසක පරිචය හෝ පොදු සම්මතය මගින් නිර්මාණය කරන ලද පත් කිරීමක, ධුරයක හෝ තනතුරක ඔහුගේ වගකීම් දරනු ලබන හෝ ඉටු කරනු ලබන තනි පුද්ගලයෙක්; හෝ

(ඉ) හමුදා බළකායක හෝ පොලිස් බළකායක සාමාජිකයකු ලෙස සේවය කිරීම ද ඇතුළුව විදේශීය රාජ්‍ය ආයතනයක අන්‍යාකාරයෙන් සේවයේ යෙදී සිටින තනි පුද්ගලයකු; හෝ

(ඊ) විදේශීය රාජ්‍යයක හෝ විදේශීය රාජ්‍යයක කොටසක විධායකයේ, අධිකරණයේ හෝ මහේස්ත්‍රාත් මඬුල්ලේ සාමාජිකයකු;

(උ) විදේශීය රාජ්‍යයක හෝ විදේශීය රාජ්‍යයක කොටසක ව්‍යවස්ථාදායකයේ සාමාජිකයකු හෝ නිලධරයකු; හෝ

(ඌ) (i) ඉහත සඳහන් යම් ඡේදයකින් ආවරණය වූ විදේශීය රාජ්‍ය නිලධරයකුගේ බලයලත් අතරමැදියකු වන්නා වූ; හෝ

(ii) ඉහත සඳහන් යම් ඡේදයකින් ආවරණය වූ විදේශීය රාජ්‍ය නිලධරයකුගේ බලයලත් අතරමැදියා ලෙස ඔහු විසින්ම හෝ ඇය විසින්ම පෙනී සිටින්නා වූ,

තනි පුද්ගලයකු,

අදහස් වේ;

"ක්‍රියා විරහිත කිරීම" යන්නෙන්, නිසි බලධරයා විසින් හෝ අධිකරණයක් විසින් ආරම්භ කරන ලද ක්‍රියාමාර්ගයක් මත පදනම්ව සහ එයට අදාළ කාලසීමාව තුළ දී දේපළ, යම් වත්කම් හෝ පරිගණක දත්ත පැවරීම, පරිවර්තනය, බැහැර කිරීම හෝ සංචලනය තහනම් කිරීම අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වන ව්‍යවස්ථාව හෝ 44 වන ව්‍යවස්ථාව යටතේ පත්කළ අධිකරණ විෂය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"පොදු ජාත්‍යන්තර සංවිධානයක නිලධරයා" යන්නෙන්,-

(අ) පොදු ජාත්‍යන්තර සංවිධානයක සේවයේ නියුක්තිකයකු; හෝ

(ආ) ගිවිසුමක් යටතේ පොදු ජාත්‍යන්තර සංවිධානයක් සඳහා කාර්යය ඉටුකරන තනි පුද්ගලයකු; හෝ

(ඇ) පොදු ජාත්‍යන්තර සංවිධානයක යම් ධුරයක් හෝ තනතුරක් දරන හෝ යම් ධුරයක හෝ තනතුරක කාර්යය ඉටු කරන තනි පුද්ගලයකු; හෝ

(ඈ) අන්‍යාකාරයෙන් පොදු ජාත්‍යන්තර සංවිධානයක සේවයේ යෙදී සිටින තනි පුද්ගලයකු; හෝ

(ඉ) (i) ඉහත සඳහන් යම් ඡේද මගින් ආවරණය වන්නා වූ පොදු ජාත්‍යන්තර සංවිධානයක නිලධරයකුගේ බලයලත් අතරමැදියකු වන්නා වූ; හෝ

(ii) ඉහත සඳහන් යම් ඡේද මගින් ආවරණය වන්නා වූ පොදු ජාත්‍යන්තර සංවිධානයක නිලධරයකුගේ බලයලත් අතරමැදියකු ලෙස ඔහු හෝ ඇය විසින්ම පෙනී සිටින්නා වූ,

තනි පුද්ගලයකු,

අදහස් වේ;

"අපරාධ මඟින් උපයාගත් දේ" යන්නට, යම් අපරාධ ක්‍රියාවක් සිදුකිරීම හෝ නොකර හැරීම හේතුවෙන් ඍජුවම හෝ වක්‍රව, සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් ලබාගන්නා ලද, රැස් කරගන්නා ලද හෝ උපයා ගන්නා ලද යම් දේපළක්, ප්‍රතිලාභයක් හෝ වාසියක් ඇතුළත් වේ;

"දේපළ" යන්නෙන්, යම් ව්‍යවහාර මුදලක් අදහස් වන අතර එයට ද්‍රව්‍යමය හෝ අද්‍රව්‍යමය, චංචල හෝ නිශ්චල, ස්පර්ශනීය හෝ අස්පර්ශනීය, ශ්‍රී ලංකාවේ හෝ අන් තැනක පිහිටි කවර හෝ වර්ගයක වත්කමක් ද බැංකු ණය, සංචාරක චෙක්පත්, බැංකු චෙක්පත්, මුදල් ඇණවුම්, කොටස්, සුරැකුම්පත්, බැඳුම්කර, අණකර, ණයවර ලිපි ඇතුළුව එහෙත් ඒවාට සීමා නොවන්නා වූ වත්කම් හෝ එම වත්කම්වලට සාක්ෂි වශයෙන් වූ හෝ සම්බන්ධතාවක් ඇත්තා වූ ඉලෙක්ට්‍රොනික හෝ ඩිජිටල් ස්වරූපයක් ඇතුළත් වූ ස්වරූපයක නෛතික ලේඛන හෝ සාධන පත්‍ර ද ඇතුළත් වන අතර, එකී යම් දේපළක යම් නීත්‍යානුකූල හෝ සාධාරණ පොලියක් ද එයට ඇතුළත් වේ;

"පොදු ජාත්‍යන්තර සංවිධානය" යන්නෙන්,

(අ) (i) රටවල් දෙකක් හෝ ඊට වැඩි ගණනක් හෝ රටවල් දෙකක හෝ ඊට වැඩි ගණනක රජයන් සාමාජිකයන් වන; හෝ

(ii) රටවල් දෙකක් හෝ ඊට වැඩි ගණනක් නියෝජනය කරනු ලබන හෝ රටවල් දෙකක හෝ ඊට වැඩි ගණනක රජයන් නියෝජනය කරනු ලබන තැනැත්තන්ගෙන් සැදුම්ලත්,

යම් සංවිධානයක්; හෝ

(ආ) (i) රටවල් දෙකක් හෝ ඊට වැඩි ගණනක් හෝ රටවල් දෙකක හෝ ඊට වැඩි ගණනක රජයන් සාමාජිකයන් වන සංවිධානයන් විසින්; හෝ

(ii) රටවල් දෙකක හෝ ඊට වැඩි ගණනක නියෝජිතයන් හෝ රටවල් දෙකක හෝ ඊට වැඩි ගණනක රජයන්ගෙන් සැදුම්ලත් සංවිධානයන් විසින්,

පිහිටුවන ලද සංවිධානයක් හෝ එකී සංවිධානයන්ගෙන් සැදුම්ලත් සංවිධාන කණ්ඩායමක්; හෝ

(ඇ) (i) (අ) හෝ (ආ) ඡේදයේ විස්තර කරන ලද සංවිධානයක ආයතනයක් හෝ කාර්යාලයක්; හෝ

(ii) එසේ විස්තර කරන ලද සංවිධානයක් විසින් හෝ එකී ආයතනයක් විසින් පිහිටුවන ලද කොමිෂන් සභාවක්, සභාවක් හෝ වෙනත් මණ්ඩලයක්; හෝ

(iii) (අ) සහ (ආ) ඡේදවලින් විස්තර කරනු ලැබූ යම් සංවිධානයක හෝ එවැනි යම් ආයතනයක, සභාවක හෝ මණ්ඩලයක යම් කමිටුවක් හෝ කමිටුවක යම් උප කමිටුවක්,

වන සංවිධානයක්,

අදහස් වේ;

"බරපතළ වරද" යන්නෙන්, මරණීය දණ්ඩනයෙන් හෝ එක් අවුරුද්දකට නොඅඩු කාලයකට බන්ධනාගාරගත කිරීමකින් හෝ දඬුවම් කරනු ලැබිය හැකි වරදක් අදහස් වේ;

"හුවමාරුවන දත්ත" යන්නට, 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතේ ඒ සඳහා දී ඇති අර්ථයම තිබිය යුතු ය.''.

පොදු සංශෝධනය.

**21.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමට අදාළ වෙනත් යම් ලිඛිත නීතියක "නිශ්චිත රට" යන වචන වෙනුවට "නිශ්චිත රට හෝ නිශ්චිත සංවිධානය" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමට අදාළ යම් දැන්වීමක, නිවේදනයක, ගිවිසුමක, සන්නිවේදනයක හෝ වෙනත් ලේඛනයක සඳහන් "නිශ්චිත රට" යන්න යෙදෙන සෑම සඳහනක්ම, "නිශ්චිත රට හෝ නිශ්චිත සංවිධානය" යන්න යෙදෙන සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ප්‍රතියෝජනය කිරීම.

**22.** ප්‍රධාන ප්‍රඥප්තියේ ඇති උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර පහත දැක්වෙන උපලේඛනය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:-

"උපලේඛනය

[5(2) වන වගන්තිය]

**අන්‍යෝන්‍ය සහයෝගීතාව ඉල්ලීමේ ආකෘති පත්‍රය**

ශ්‍රී ලංකාවේ මධ්‍යම බලධරයා වෙතට ය.

**1. රටේ හෝ සංවිධානයේ නම:**...............................................................................

**2. නිසි බලධරයා පිළිබඳ විස්තර:**

2.1 නම: ...................................................................................................

2.2 පදවි නාමය හෝ නිල නාමය:........................................................................

2.3 අමාත්‍යාංශය, ආයතනය හෝ දෙපාර්තමේන්තුව:................................

2.4 ලිපිනය: ...................................................................................................

2.5 දුරකතන අංකය: ...........................................................................................

2.6 ෆැක්ස්: ...................................................................................................

2.7 විද්‍යුත් තැපැල: ...........................................................................................

2.8 වෙබ් අඩවිය: ...................................................................................................

**3. ඉල්ලීම පිළිබඳ නීතිමය පදනම:**

**3.1 ඉල්ලීමේ නීතිමය පදනම සඳහන් කරන්න:***

☐ ජාත්‍යන්තර හෝ කලාපීය සම්මුතිය (කරුණාකර නිශ්චිතව සඳහන් කරන්න)......................................................................................

☐ ගිවිසුම (කරුණාකර නිශ්චිතව සඳහන් කරන්න).
...................................................................................................

☐ සංවිධානය (කරුණාකර නිශ්චිතව සඳහන් කරන්න)
...................................................................................................

☐ වෙනත් (කරුණාකර නිශ්චිතව සඳහන් කරන්න)
...................................................................................................

*අදාළ කොටුවේ "✓" ලකුණ යොදන්න.

**3.2 අන්තර් හුවමාරුව පිළිබඳ ප්‍රකාශය:** [ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය ඇමුණුම් සපයන්න.].

...................................................................................................

...................................................................................................

...................................................................................................

...................................................................................................

...................................................................................................

...................................................................................................

**3.3 සම්මුතිය හෝ ගිවිසුම යටතේ අවශ්‍ය වන්නා වූ වෙනත් යම් අතිරේක තොරතුරු:** [ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය ඇමුණුම් සපයන්න.]

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

**4. සහාය දක්වන ආකාරය:**

**4.1 සහාය දක්වන ආකාරය සඳහන් කරන්න:***

☐ සැකකරුවන්/සාක්ෂිකරුවන්/වෙනත් තැනැත්තන් සහ ඔවුන් සිටින ස්ථානය සොයාගැනීම.

☐ සාක්ෂි, ලේඛන, වෙනත් භාණ්ඩ හෝ තොරතුරු ලබාගැනීම සඳහා කටයුතු පිළියෙල කිරීම.

☐ සිතාසි භාරදීම.

☐ සාක්ෂි දීමේ කාර්යය සඳහා සිරකරුවන් හෝ සාක්ෂිකරුවන් ඉවත් කිරීම සඳහා කටයුතු පිළියෙල කිරීම.

☐ සෝදිසි කිරීම සහ තහනමට ගැනීම සඳහා සෝදිසි වරෙන්තුවක් නිකුත් කිරීමට කටයුතු පිළියෙල කිරීම.

☐ ආඥා බලාත්මක කිරීම.

☐ දේපළ අහිමි කිරීම හෝ ක්‍රියා විරහිත කිරීම.

☐ දේපළ පිහිටි ස්ථානය සොයාගැනීම, එය හඳුනාගැනීම සහ එහි වටිනාකම තක්සේරු කිරීම.

☐ පරිගණක දත්ත හෝ හුවමාරුවන දත්ත කඩිනමින් සුරක්ෂිත කිරීම.

☐ සුරක්ෂිත දත්ත මුදාහැරීම.

☐ වෙනත්. (කරුණාකර නිශ්චිතව සඳහන් කරන්න)....................................

*අදාළ කොටුවේ/කොටුවල "✓" ලකුණ යොදන්න.

**4.2 වැදගත් තොරතුරු පිළිබඳ සම්පූර්ණ විස්තරය:** [ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය ඇමුණුම් සපයන්න.]

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

**5. අදාළ නියමිත බලධරයා:**

**5.1 අදාළ නියමිත බලධරයාගේ ප්‍රභේදය සඳහන් කරන්න.***

☐ නීතිය බලාත්මක කිරීමේ හෝ විමර්ශනය කිරීමේ බලධරයා.

☐ නඩු පැවරීමේ බලධරයා.

☐ අධිකරණමය බලධරයා.

☐ වෙනත්. (කරුණාකර නිශ්චිතව සඳහන් කරන්න)
*අදාළ කොටුවේ/කොටුවල "✓" ලකුණ යොදන්න.

**5.2 අදාළ නියමිත බලධරයාගේ නම සහ වෙනත් අදාළ විස්තර සපයන්න. (ඔහුගේ කර්තව්‍ය, ප්‍රධාන වගකීම් හා ඔහුව සම්බන්ධ කරගත හැකි විස්තර ඇතුළත්ව):** [ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය ඇමුණුම් සපයන්න.]

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

**6. පූර්ව සම්බන්ධතා:**

**ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකු හෝ නියමිත බලධරයකු සමග මේ ඉල්ලීම සම්බන්ධයෙන් ඇතිකරගන්නා ලද පූර්ව සම්බන්ධතා පිළිබඳ විස්තර සපයන්න.** [ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය ඇමුණුම් සපයන්න.].

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

7. වැරදි ලැයිස්තුව:

වරද/වැරදි පිළිබඳ පහත විස්තර සපයන්න. [ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය ඇමුණුම් සපයන්න.]

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

7.1 වරද:

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

7.1.1 වරද සම්බන්ධයෙන් පවත්නා ජාතික ව්‍යවස්ථාව/ව්‍යවස්ථා පිළිබඳ විස්තර:

....................................................................................................................

....................................................................................................................

....................................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

**7.1.2 අදාළ විධිවිධාන:**

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

**7.1.3 වරද සඳහා දෙනු ලබන උපරිම දඬුවම්:**

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

....................................................................................................

**8. තැනැත්තා/තැනැත්තන් පිළිබඳ විස්තර**

**8.1 සැකකරුවන්/වරදකරුවන්:**

ඔබ දන්නේ නම්, ඉල්ලීමට විෂය වන තැනැත්තන් හඳුනාගැනීම පිණිස ඔහුගේ හෝ ඔවුන්ගේ සම්පූර්ණ නම/නම්, වෙනත් නම්, ස්ත්‍රී/පුරුෂ භාවය, ලිපිනය/ලිපින, උපන් දිනය, උපන් ස්ථානය, උපතේ දී ජාතිකත්වය, විදේශ ගමන් බලපත්‍ර අංකය සහ ස්ථානය, පුරවැසිභාවය/පුරවැසිභාවයන්, භාෂාව/භාෂා සහ එවැනි වෙනත් දේ ද ඇතුළත්ව අවශ්‍ය තොරතුරු සපයන්න. [ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය ඇමුණුම් සපයන්න.]

....................................................................................................

....................................................................................................

....................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

ඔබ දන්නේ නම් සමාගමේ හෝ සංවිධානයේ නම, සංස්ථාගත කළ ස්ථානය, සංස්ථාගත කළ දිනය, ලිපිනය/ලිපින, ඇතුළත්ව ඉල්ලීමට සම්බන්ධ වන සමාගම හෝ සංවිධානය හඳුනාගැනීම පිණිස තොරතුරු හා නිලධරයාව හඳුනාගැනීමේ තොරතුරු, සම්පූර්ණ නම, නිල නාමය/තනතුර, ලිපිනය, ඉතිහාසය ඇතුළත්ව අධ්‍යක්ෂවරයාගේ/ප්‍රධානියාගේ/පාලකගේ විස්තර සපයන්න. [ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය ඇමුණුම් සපයන්න.]

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

.......................................................................................................

**9. පහත දැක්වෙන විස්තර ද ඇතුළත්ව අදාළ සියලු කරුණුවල කෙටි සාරාංශයක් ඉදිරිපත් කරන්නඃ-**

- සම්බන්ධිත තැනැත්තන් අත්අඩංගුවට ගැනීමට, චෝදනා ලැබීමට හෝ නඩු පැවරීමට හේතුවන;
- යම් වැළැක්වීමේ හෝ අහිමි කිරීමේ ආඥාවක් කිරීමට හේතුවන;
- සාක්ෂිමය කාර්යය සඳහා යම් දේපළක් තහනමට ගැනීමට හේතුවන;
- ප්‍රශ්නගත සාපරාධී හැසිරීම සහ ඉල්ලා සිටින සහාය අතර ඇති සම්බන්ධතාව පෙන්නුම් කරන;
- ඉල්ලීම ක්‍රියාත්මක කිරීම නඩුවේ ප්‍රතිඵලවලට කෙසේ දායකත්වය ලබාදෙයි ද යන වග පැහැදිලිව පෙන්නුම් කරන;
- වෙනත් යම් තොරතුරු.

[ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය ඇමුණුම් සපයන්න.]

**10. නඩුවේ වර්තමාන තත්ත්වය පිළිබඳව අදාළතාවය මත පහත දැක්වෙන කරුණු ද ඇතුළත්ව කෙටි සාරාංශයක් සපයන්නඃ-**

- විමර්ශන (ආරම්භ කරන ලද, පවත්වාගෙන යන, අවසන් කරන ලද);
- අදාළ දේපළ (රඳවා තබන ලද, ක්‍රියා විරහිත කරන ලද, තහනමට ගන්නා ලද, රාජ සන්තක කරන ලද);
- අත්අඩංගුවට ගැනීම් (දිනය, වරෙන්තු වැනි දේ);
- ඉදිරිපත් කරනු ලබන චෝදනා;
- නඩු පැවරීම (ආරම්භ කරන ලද, පවත්වාගෙන යන, අවසන් කරන ලද);
- නඩු විභාගය (ආරම්භ කරන ලද, පවත්වාගෙන යන, අවසන් කරන ලද);
- දඬුවම් පමුණුවන ලද/දඬුවම් නියම කරන ලද දිනය;
- අභියාචනය/අභියාචනා;
- වෙනත් තොරතුරු.

[ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය ඇමුණුම් සපයන්න.]

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

**11. හදිසි බවඃ**

**11.1 ඉල්ලීම හදිසි වන්නේ ද? (ඔව්/නැත)***

* අදාළ නොවන කොටස ඉවත් කරන්න.

11.2 හදිසි භාවයට හේතුව/හේතු සපයන්න සහ අදාළ අවසන් දිනය දක්වන්නः

[ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය ඇමුණුම් සපයන්න.]

12. ඉල්ලීම ක්‍රියාත්මක කිරීමට අදාළ වෙනත් යම් විශේෂ තොරතුරු සපයන්න. [ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය ඇමුණුම් සපයන්න.]

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

13. ඇමුණුම් ලැයිස්තුවः [ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවන්නේ නම්, කරුණාකර අවශ්‍ය ඇමුණුම් සපයන්න.]

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

14. උපදෙස්ः

(1) ලේඛනයන්හි පරිවර්තන දිවුරුම් දුන් හෝ බලයලත් භාෂා පරිවර්තකයකුගෙන් පරිවර්තනය කරවා ඉංග්‍රීසි භාෂාවෙන් එවිය යුතු ය.

(2) ලේඛනයක්-

(අ) ස්වකීය රටේ හෝ ස්වකීය රටට අයත් විනිශ්චයකාරවරයකු, මහෙස්ත්‍රාත්වරයකු හෝ නිලධරයකු අත්සන් කර හෝ සහතික කර ඇත්නම්ත සහ

(ආ) ස්වකීය රටෙහි සාක්ෂිකරුවකුගේ හෝ ආණ්ඩුවේ නිලධරයකුගේ දිවුරුම පිට හෝ නිශ්චිත රටෙහි රාජ්‍ය හෝ නිල මුද්‍රාවෙන් හෝ ස්වකීය රටෙහි රාජ්‍ය අමාත්‍යවරයකුගේ හෝ දෙපාර්තමේන්තුවක හෝ නිලධරයකුගේ නිල මුද්‍රාවෙන් සැබෑ බවට සහතික කර තිබෙන්නේ නම්,

ලේඛනය යථා පරිදි සැබෑ බවට සහතික කර තිබෙන සේ සලකනු ලබයි.

(3) සියලු ලේඛන සවිස්තරාත්මක, නිරවද්‍ය හා පහසුවෙන් තේරුම්ගත හැකි ආකාරයෙන් තිබිය යුතු ය.

15. ප්‍රකාශය:

...........................................................................................................(සම්පූර්ණ නම) වන මම, නිසි බලධරයා වශයෙන්/ එවැනි ඉල්ලීමක් සිදුකිරීමට සෘජුවම මා වෙත පැවරී ඇති බලතල යටතේ*, මෙම ඉල්ලීම ....................................(නගරය/ ස්ථානය) හිදී ................ (කේතය) ...................................... (රට) වේදී ................................. (දිනය) දින අත්සන් කරමි.

............................................................................

අත්සන

නිශ්චිත රටෙහි/සංවිධානයෙහි* නිසි බලධරයා

............................................................................

නිල මුද්‍රාව

* අදාළ නොවන කොටස ඉවත් කරන්න.".

අනනුකූලතාවක් ඇති වූ අවස්ථාවක දී සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**23.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.